උරුමය උල්පත් 26
පුජ්‍ය පිටිදූවේ සිරිධම්ම හිමි

ප්‍රශ්නය : අවසරයි ස්වාමීන්වහන්ස, අද දේශීය හෝ විදේශීය මට්ටමින් පැතිරෙන තොරතුරු තාක්ෂණ යුගය දෙස බැලූ විට එහි ආත්මය තිබෙන්නේ බුද්ධ ධර්මය තුළයි. අපි එය ඉදිරියට ගෙන යන්නේ කොහොමද?

පිළිතුර : බුද්ධ ධර්මය තුළ තිබෙන සන්නිවේදන ක්‍රමවේදන වෙත කිසිම ආකාරයෙන් නවීන විද්‍යාවටවත් ළඟා වෙන්න හැකියාවක් නැහැ. අංගුත්තර නිකායේ, තික නිපාතයේ, අනානන්ද වර්ගයේ එන දසවැනි සූත්‍රයේ දී එයට හේතු වශයෙන් සඳහන් කරන්න පුළුවන්. ''ආනන්ද, තථාගතයන් වහන්සේට අවශ්‍යනම් මේ විශ්වයේ පමණක් නොව මෙයට ඈතින් තිබෙන්නා වූ විශ්වයක් සමඟ වුවත් සන්නිවේදනය කිරීමට හැකියි'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ ආනන්ද හාමුදුරුවන්ට දේශනා කරනවා. එසේ සන්නිවේදනය කරන්නේ වචන හරහා නෙමෙයි. එය කරන්නේ සිතුවිලි හරහායි. සන්නිවේදනයේ උච්ඡම ස්ථානය එතැනයි.

අද දියුණු වූ නූතන විද්‍යාව තුළ වචන වලින් පරිබාහිර වූ සන්නිවේදන ක්‍රම සොයා ගෙන තිබෙනවා. බුදු දහම තුළත් මෙය තිබෙනවා. ඊදාහ බ්බටම්ටැ හෙවත් කායික වශයෙන් යම් යම් දේ යොදා ගෙන සන්නිවේදනය කිරීම එයට උදාහරණයක්. මුහුණ ආදි ඉන්ද්‍රියයන් වල හැසිරීම් වලින් තම හැඟීම් ප්‍රකාශ කිරීමට හැකිවීම මනුෂ්‍යා තුළ තිබෙන විශිෂ්ඨ ලක්ෂණයක්. මනුෂ්‍යයා එය වඩා සාර්ථකව සිදු කරනවා. බුදු දහම මගින් ලබා දෙන මේ පණිවිඩය ඉදිරියට ගෙන යන නූතන ලෝකයේ ඇති තොරතුරු තාක්ෂණය, සන්නිවේදනය, මාධ්‍ය ආදි මේ හැම එකකට අපි මෙවලමක් ලෙස යොදා ගත යුතුයි. දහමේ පණිවිඩය ලොවට ලබා දීම සඳහා බුදුරජාණන් වහන්සේත් මාධ්‍යයක් භාවිතා කළා. එදා ඉන්දියානු සමාජය තුළ මෙය සකස් වී නොතිබූ නිසා උන් වහන්සේට වෙනස් ආකාරයේ ක්‍රම මේ සඳහා භාවිතා කරන්න සිදු වුණා. අද නූතනයේ විශේෂයෙන්ම පරිඝණකය

ආශ්‍රයෙන් ඇති වී තිබෙන පහසුකම් හරහා අන්තර්ජාලය යොදා ගෙන බුදු දහම ව්‍යාප්ත කිරීමේ වටපිටාවක්, පරිසරයක් ගොඩ නගන්න පුළුවන්.

ප්‍රශ්නය : එය ප්‍රායෝගිකව කරන්නේ කෙසේද?

පිළිතුර : අන්තර් ජාලයේ තිබෙන පහසුකම් මූලික වශයෙන් මේ සඳහා යොදා ගන්න පුළුවන්. නමුත් අන්තර්ජාලය ලොව තුළ කොතරම් දියුණු මට්ටමකට පැමිණියත්, පරිඝණක තාක්ෂණය කොතරම් දියුණු වුවත් පොත්පත් සඳහා තිබෙන ඉල්ලුම කිසිදාක පහල වැටෙන්නේ නැහැ. එය මනුෂ්‍යාගේ මානව පරිනාමයෙන්ම උරුම වූ දෙයක්. ඒ නිසා යම් කෙනෙකුට බුදුදහම පිළිබඳ අධ්‍යයනය කරන මධ්‍යස්ථානයක් පිහිටුවන්න පුළුවන්නම් එය ඉතාමත් වැදගත්. එය ලංකාවට පමණක් නොව මුළු මහත් ලෝකයට වැදගත්. එයින් බුදු දහම, බුදු දහමේ පණිවිඩය පිළිබඳ නොදන්න අයට දැන ගන්න හැකි පරිසරයක් සකස් කර දෙනු ඇත. එයින් ඉතා සාර්ථක ලෙස බුදු දහම ව්‍යාප්ත කිරීමේ කටයුත්ත කරන්න පුළුවන්. තරුණ පිරිස මෙම කටයුතු වලදී මූලිකත්වය ගත යුතුයි.

ප්‍රශ්නය : ඔබවහන්සේට තරුණ සමාජයට බුදු දහම සම්බන්ධව විශාල පණිවිඩයක් යවන්න හැකි වී තිබෙනවා. ඒ පිළිබඳ විග්‍රහයක් කළොත්?

පිළිතුර : ලෝකයේ තිබෙන ආගම් සමඟ සංසන්දනාත්මකව බලන විට බුදු දහම මනුෂ්‍යාගේ බුද්ධියට, ප්‍රඥාවට සමීප වූ ස්වභාව ධර්මය සමඟ බැඳුණු ඉගැන්වීමක්. එයට වඩා වෙනස් දෙයක් එහි නැහැ. බුදු දහම තුළ ආගමක ලක්ෂණ පෙනෙන්නේ පසු කාලයේදී. මුලින්ම එය ඉගැන්වීමක්. ගුරුවරයෙක් සිටිනවා. ඔහු තමන්ගේ ශිෂ්‍යයන්ට උගන්වනවා තිබෙනවා. මෙහිදි මුළු සොබා දහම පිළිබඳවම උගන්වා තිබෙනවා. බුදු දහම කියන්නේ මෙයයි. යමෙක් බුදු දහම නිවැරදිව ප්‍රායෝගිකව තේරුම් ගත්තේ නම් ඔහුව මුළු ලෝකයම තේරුම් ගන්න පුළුවන්. අපි සොබා දහම කියන වචනය අර්ථ ගන්වා බලමු. එයට බුදු දහමෙන් හොඳ උත්තරයක් ලබා දෙනවා. ස්වභාධර්මය කියන්නේ නියාම ධර්ම පහක්. මේ විශ්වය තුළ ක්‍රියාත්මක වන කාරණා පහක් තිබෙනවා. පළමු වැන්න

බීජ නියාමය. එය ජයහිසජ්ක ධරට්ඨසජ ධරාරර ලෙස හඳුන්වනවා. මෙහිදි සියලු ජෛව රසායනික ප්‍රතික්‍රියා පිළිබඳ සිද්ධාන්ත බීජ නියාමයට අයත් වෙනවා. දෙවැනි කාරණය උතු නියාමය. එය ජයහිසජ්ක ෂබදරට්ඨසජ ධරාරර ලෙස හඳුන්වනවා. යම් යම් භෞතික සිද්ධාන්ත, රසායනික ප්‍රතික්‍රියා, අකාබනික ප්‍රතික්‍රියා පිළිබඳ සියලු ඉගැන්වීම් මෙය තුළ තිබෙනවා. තෙවැන්න ධර්ම නියාමය. ධරාරර දෙ එයැ බදරපග භෞකිත විද්‍යාවේ උගන්වන්නා වු සියලු සිද්ධි ධර්ම නියාමය තුළ අන්තර්ගතව තිබෙනවා. සිව් වැන්න චිත්ත නියාමය - ධරාරර දෙ එයැ පසබා හිත ගැන, මනස ගැන කරන අධ්‍යයනය. පස්වැනිව කර්ම නියාමය. පුද්ගලයා විසින් කරන ලද හොඳ-නරක පුද්ගලයා පසුපසින් ගමන් කරනවා. එය අපි කර්මය ලෙස හඳුන්වනවා. අපි නියාම ධර්ම පහ ලෙස උගන්වනු ලබන්නේ මෙම කාරණා පහයි. ස්වභාවධර්මය ලෙස හඳුන්වන්නේ මෙම නියාම ධර්ම පහයි. බුදු දහම පුරාම කර තිබෙන්නේ මෙම නියාම ධර්ම පහ පිළිබඳ අධ්‍යයනය කර ප්‍රකාශ කිරීමයි. තරුණ පිරිසට යමක් තර්කානුකූලව කියන විට, බුද්ධිමත්ව යමක් පහදා දෙන විට ආකර්ශනය වන ආකාරයට ප්‍රකාශ කිරීම බුදු රජාණන් වහන්සේ තුළ තිබූ විශිෂ්ඨත්වයයි. පුංචි කතා, උපමා, ජන කතා ආදි මේ හැම දෙයක්ම උන් වහන්සේ ප්‍රකාශ කළා. සකුනග්ගි සුත්‍රයේ සඳහන් වෙනවා. තමන්ට ගැලපෙන හොඳ තැනක ජීවත් වූ විට ඒ ජීවත් විමත් සමගම තමන්ට තිබෙන බාධක සියල්ල මඟ හැරී යන බව උන්වහන්සේ දේශනා කළා. මෙය ප්‍රායෝගික කාරණයක්. එය පැහැදිලි කරන්න පුංචි කතාවක් දේශනා කළා.

මහණෙනි, ඉස්සර කාලයේ උකුස්සෙක් සිටියා. මෙම උකුස්සා කැට කුරුල්ලෙක්ව අල්ලා ගත්තා. පස් තුළ ජීවත් වන පුංචි කුරුල්ලෙක් කැට කුරුල්ලා ලෙස හඳුන්වනවා. මේ උකුස්සා කැට කුරුල්ලා අල්ලා ගෙන ඉහළ යනවා. එවිට කැට කුරුල්ලා මෙසේ කියනවා. ''මා ඔබ අල්ලා ගත්තේ මට නොගැලපෙන තැනක මා ඇවිදින්ට ආපු නිසයි. මම මට ගැලපෙන තැන සිටියා නම් මා අල්ලා ගන්න ඔබට හැකියාවක් නැහැ.'' එවිට උකුස්සා ''හොඳයි එහෙනම් බලමු කියා'' නැවත පහළට පැමිණ කැට කුරුල්ලා තබා පැත්තකට වී උකුස්සා බලා සිටිනවා. දැන් කැට කුරුල්ලා පස් ගොඩ අස්සේ හැංගෙනවා. එවිට උකුස්සා වේගයෙන්

පියාඹගෙන ඇවිත් පස් ගොඩේ හැපෙනවා. පස් ගොඩේ උකුස්සාගේ පපුව හැපී උකුස්සා මිය යනවා. ''මහණෙනි, බලන්න උකුස්සා මිය ගියා. සුදුසු තැන වාසය කළ නිසා කැට කුරුල්ලා ආරක්ෂා වුණා'' යනුවෙන් බුදුන් වහසේ දේශනා කළා.

සමාජය තුළ තිබෙන ප්‍රායෝගික වූ මෙවැනි ක්‍රම, මිනිසුන්ගේ හදවතේ රිද්මය බුදුන්වහන්සේ විසින් නිවැරදිව හඳුනා ගත්තා. යම් කෙනෙක් මෙම දහම ව්‍යාප්ත කිරීමට, මේ දහමේ පණිවිඩය සමාජ ගත කිරීමට ඒ රිද්මය නිවැරදිව හඳුනා ගතහොත් තරුණ පිරිස පමණක් නොව දෙවියන්, බ්‍රහ්මයන් පවා මෙයට ආකර්ශනය වී එනවා. එය වලක්වන්න බැහැ.

ප්‍රශ්නය : මේ පණිවිඩය ඉදිරියට ගෙන යෑමේදී ඔබ වහන්සේගේ අත්දැකීම් අනුව යුගයට ගැලපෙන ආකාරයෙන් සන්නිවේදන පැත්තෙන් කළ යුත්තේ කුමන ආකාරයේ වෙනස්කම්ද?

පිළිතුර : බොහෝ වෙනස්කම් කළ යුතුයි. දැනට පවතින අපේ සාම්ප්‍රදායික ධර්ම දේශනා ක්‍රමය දෙස බැලූ විට එය සකස් වී තිබෙන්නේ නූතන තාක්ෂණ යුගයට ගැලපෙන ආකාරයට නෙවෙයි. එය සකස් වී තිබෙන්නේ මීට අවුරුදු 1000 කට පමණ එපිට තිබුණු ගොවි යුගයකට ගැලපෙන ආකාරයටයි. අපි උදාහරණ වශයෙන් දක්වන්නේ ඒ ගොවි යුගයේ තිබුණ උදාහරණයි. සද්ධර්ම රත්නාවලිය, බුත්සරණ වැනි පොතක් කියවා බැලූ විට එහි සඳහන් වන්නේ ගොවි යුගයේ උදාහරණයි. අද සමාජයට ධර්මය දේශනා කරන විට අද සමාජයේ උදාහරණ දැක්විය යුතුයි. මිනිසුන්ට දැනෙන දේවල්, මිනිසුන්ගේ හදවතේ රිද්මය, මිනිසුන්ට තේරෙන දේවල් තුළින් උදාහරණ ගෙන පැහැදිලි කළ විට ඉතාමත්ම හොඳින් එය කරන්න පුළුවන්. බුද්ධිමත්ව සිතීමට හැකිවීම ස්වභාවයෙන්ම මනුෂ්‍යයාට උරුම දෙයක්. ලොව අනෙක් සතුන්ට වඩා මනුෂ්‍යා වෙනස් වන්නේ මෙම චින්තනය නිසයි. යම් කිසි කෙනෙක් මනුෂ්‍යයාගේ බුද්ධියට, ප්‍රඥාවට, මනසට, හිතට කතා කරනවානම් ඒ කතා කිරීම ඉතාමත්ම සාර්ථකයි. සමහර විට මනුෂ්‍යාගේ හැඟීම් වලට කතා කරන්න පුළුවන්. බණ අසා අවසන් වූ විට මිනිසුන් හඬන අවස්ථා තිබෙනවා. නමුත් කල්පනා කර බැලූ විට ඒ හැඩීමට

හේතුවක් නැහැ. එය සාර්ථක ධර්ම දේශනාවක් නෙමෙයි. බුදුවරයෙක් ලොව ධර්මය දේශනා කරන්නේ හඬන මිනිසුන් හිනැස්සීම, සැනසීම ලබා දීම සඳහායි. නමුත් අපි බණ කියන විට කවුරුන් හෝ හඬනවානම් එය ප්‍රායෝගික නැහැ. එයින් අපි බලාපොරොත්තු වූ පණිවිඩය සමාජ ගත වී නැහැ. සාම්ප්‍රදායිකව සිතූ ක්‍රමය වෙනස් කර මිනිස්සු බුද්ධිමත්ව සිතීම අද අවශ්‍යයි. නූතන සමාජයට බුදු දහම දීමේදී මෙම වෙනස් කම් අපි සිදු කළහොත් කෙටි කාලයක් ඇතුලත විශාල පණිවිඩයක් සමාජගත කරන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ කළෙත් එයයි.

ප්‍රශ්නය : මේ වෙනස් කිරීම සඳහා පිරිවෙන් අධ්‍යාපනයේ වෙනස් කමක් කළ යුතුද?

පිළිතුර : භික්ෂුව කියන පුද්ගලයා නූතන දැනුමෙන් සන්නද්ධ වූ කෙනෙක් විය යුතුයි. එසේ නොමැතිව මේ අලුත් ලොවට බුදු දහම ගෙන යන්න බැහැ. අපි එදා කියූ සාම්ප්‍රදායික දේ ම නැවත ප්‍රකාශ කළ විට නූතන තාක්ෂණයෙන්, දැනුමෙන් පිරුණු ලෝකය ඒ සාම්ප්‍රදායික දේවල් ප්‍රතික්ෂේප කරනවා. අද සමාජයට බුදු දහමේ පණිවිඩය දෙන විට එය දිය යුත්තේ නූතන සමාජයෙන් අපි ලබා ගත් දැනුම, ආකල්ප හා කුසලතා සමගයි. මා හිතන ආකාරයට පිරිවෙන් අධ්‍යාපනය බොහෝ නවීකරණය විය යුතුයි. පැරැණි දේ අලුත් සමාජයට ගෙන එන විට එහි මූලික ස්වරූපය වෙනස් නොකර, එය පැහැදිලි කරන ආකාරය පමණක් වෙනස් කිරීමෙන් කිසිම වරදක් සිදු වන්නේ නැහැ. ඒ නිසා භික්ෂුවක් පරිඝණක, විවිධ භාෂාවන්, විද්‍යාව හා තාක්ෂණය, අලුත් විෂයයන් පිළිබඳව පරිපූර්ණ දැනුමකින් යුක්ත කෙනෙකු විය යුතුයි. ඒ වගේම ත්‍රිපිටකය පිළිබඳ සම්පූර්ණ දැනුම තිබිය යුතුයි. සාර්ථක භික්ෂුවකගේ අනුශාසනා සමාජයට ලැබෙන්නේ එවිටයි.

ප්‍රශ්නය : ඒ වෙනස, පරිවර්තනය සඳහා නායකත්වය ලැබිය යුත්තේ කෙතැනින්ද? එය ලැබිය යුත්තේ රජයෙන්ද? නැතිනම් ඔබවහන්සේලාගෙන්ද?

පිළිතුර : මේ දෙගොල්ලන්ගෙන්ම නායකත්වය මේ සඳහා අවශ්‍යයි. බුදු දහම පිළිබඳ පුළුල් දැක්මක් රජයට තිබිය යුතුයි. ලෝකයේ යම් යම් රටවල් සඳහා ආවේනික වූ දේ තිබෙනවා. ඒ ආකාරයෙන් ශ්‍රී ලංකාව ථෙරවාදි බුදුදහමේ කෙන්ද්‍රස්ථානය ලෙස ලෝකය පිළිගන්නවා. මෙය මුළු ලෝකයේම ඇස අපේ දෙසට යොමු වන අවස්ථාවක්. ඒ නිසා අපි එය සංවර්ධනය කළ යුතුයි. රැක ගත යුතුයි. භික්ෂුවක් කියන්නේ මඟ පෙන්වන්නෙක් පමණයි. භික්ෂූන් වහන්සේලාට ආර්ථික හැකියාවක් නැහැ. ආර්ථික හැකියාව තිබෙන්නේ රාජ්‍යයට හා රටේ සිටින වාණිජ පන්තියට පමණයි. බුදුරාජණන් වහන්සේ විශාල සමාජ ශෝධකයෙක්. සමාජයේ තිබූ සාම්ප්‍රදායික මතවාද සියල්ල මිනිසුන්ගේ හිත් වලින් ඉවත් කර මනුෂ්‍යත්වයට ගැලපෙන වට පිටාවක් උන්වහන්සේ නිර්මාණය කළා. උන්වහන්සේ මෙය සිදු කළේ තනියම නෙමෙයි. උන්වහන්සේ වටා විශාල පිරිසක් සිටියා. විශාල තරුණ ජවයක් උන්වහන්සේට තිබුණා. සැරියුත් මහ රහතන් වහන්සේ, මුගලන් මහ රහතන් වහන්සේ, ආනන්ද හාමුදුරුවෝ, මහා කාශ්‍යප හාමුදුරුවෝ, සුභූති මහ රහතන් වහන්සේ, මහා කච්චායන මහ රහතන් වහන්සේ බුදුරජාණන්වහන්සේගේ ළඟින් සිට මේ ශාසනික වැඩපිළිවෙලට උදවු කළා. ඒ වගේම මහා ප්‍රජාපතී ගෝතමිය, යශෝදර මෙහෙණින් වහන්සේ වැනි දහස් ගණනක් වූ භික්ෂූණීන් වහන්සේලා බුදුරජාණන් වහන්සේගේ වැඩපිළිවෙලට සහාය දුන්නා. එවගේම අනේපිඩු සිටුතුමා, කොසොල් රජතුමා වැනි රාජ්‍ය පාලකයන් ද ශාසන ව්‍යාප්තිය සඳහා සිය රාජ්‍ය බලය යෙදෙව්වා. ධනය මේ ශාසනික වැඩපිළිවෙල සඳහා පරිත්‍යාග කළා. ඒ නිසා කෙටි කාලයක් තුළ බුදුදහම ඉන්දියාව තුළ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වුනා. බුදුරාජණන්වහන්සේ හොඳ සමාජ නායකත්වයක් ලබා දුන්නා. භික්ෂුවට හොඳ සමාජ නායකත්වයක් ලබා දෙන්න පුළුවන්. නමුත් භික්ෂුවකට අවශ්‍ය ආර්ථික පරිසරය හා අනෙකුත් සම්බන්ධතා ගිහියන් හා අනෙක් භික්ෂූන් වහන්සේලා විසින් ලබා දිය යුතුයි. මෙය සාර්ථක වන්නේ එවිටයි. ඒ වගේම පිරිවෙන් අධ්‍යාපනය සාර්ථක කිරීම සඳහා රජය මගින්ද විශාල වැඩ කොටසක් කළ යුතුයි. ඒ වගේම භික්ෂූන් වහන්සේලාත් මේ පිළිබඳ සොයා බලා නායකත්වය ලබා දුන හොත් ඉතාමත් සාර්ථක අධ්‍යාපන රාමුවක් හදන්න පුළුවන්.

ප්‍රශ්නය : සමාජය තුළින් ඔබවහන්සේලාට අවශ්‍ය ශක්තිය ලබා දිය යුතුයි. පසුගිය අවුරුදු විස්සක පමණ කාලය පිළිබඳ බලන විට ඒ ශක්තිය අඩු වී තිබෙනවාද? වැඩි වී තිබෙනවාද?

පිළිතුර : ඒ ශක්තිය වැඩි වී තිබෙනවා. මිනිස්සු බුද්ධිමත් වන විට, දැනුමෙන් සන්නද්ධ වන විට, තාක්ෂණයෙන් දියුණු වන විට බුදු දහම ඉදිරියට යනවා. එය වලක්වන්න බැහැ. විසිවැනි ශතවර්ෂයේ ලොව පහළ වූ මහා විද්‍යාඥයා ඇල්බට් අයින්ස්ටයින්. මේ විශ්වයටම පොදු වූ ආගම, ඉගැන්වීම බුදු දහම බව සඳහන් කළා. ''ෘැැච සෘබටැ - ගැඹුරු මුහුද'' නමින් ආතර් සී ක්ලාක් මහතාගේ පොතක් තිබෙනවා. වසර 2050 වන විට ලෝකයේ ආගම් අතරින් බහුතර පිරිසක් පිළිගන්නා ආගම බවට බුදු දහම පත් වන බව එතුමා එහි සඳහන් කරනවා. එසේ වන්නේ බුදුදහම තුළ තිබෙන යම් ආශ්චර්යයක් නිසා නෙමෙයි. මිනිසා සහ ස්වභාව ධර්මය පිළිබඳව කළ යථාර්තවාදි විග්‍රහය නිසයි. විද්‍යාවෙන්ද අපි දකින්න උත්සාහ ගන්නේ එයයි. විද්‍යාව දියුණු වෙන්න, දියුණු වෙන්න මේ යථාර්ථවාදි විග්‍රය අපට, වැටහෙන විට අපි නොදැනුවත්වම එයට යොමු වෙනවා.

අද තරුණ පිරිස් තුළ විශාල ප්‍රබෝධයක් ඇති වී තිබෙනවා. අපි ධර්ම දේශනාවක් සඳහා ගිය විට එය වටා විශාල තරුණ පිරිසක්, තරුණ ජවයක් එකතු වෙනවා. බොහෝ වේලාවට ඒ ධර්ම දේශනා සංවිධානය කරන්නේ ඒ තරුණ අය විසින්මයි. එයින් හොඳ පණිවිඩයක් සමාජයට යනවා. අපි ධර්මය දේශනා කළ යුත්තේ වයසට ගොස් කිසිවක් කර ගැනීමට නොහැකිව සිටින අයට නෙමෙයි. ඒ අයගෙන් යමක් සමාජ ගත කරන්න බැහැ. ඒ අය සමාජයෙන් ඉවත් වෙන්න හදන අය. සමාජයට යන්න හදන ළමයිට හා තරුණයන්ට මේ පණිවිඩය ලබා දුන් විට ඉදිරි අවුරුදු දහය ඇතුළත මේ රට තුළ අපි බලාපොරොත්තු නොවුණු විශාල අධ්‍යාත්මික පරිවර්ථනයක් සිදු වේවි. යම් තැනක අධ්‍යාත්මික පරිවර්තනයක් සිදු වූ විට එහි ආර්ථිකයත් ඉබේම දියුණු තත්ත්වයට පත් වෙනවා. මනුෂ්‍යයන්ට හොඳ හිතක් තිබෙන විට, ඒ හොඳ හිතට ඕනෑම දෙයක් එකතු කර ගන්න පුළුවන් වෙනවා. හිත නරක් වූ විට භෞතික සම්පත් ද අපෙන්

ඈත් වෙනවා. හිත හොඳ වෙන විට භෞතික සම්පත් අපව සොයා ගෙන එනවා. ඒ නිසා හොඳ හිතක් හදා ගැනීමේ වැඩ පිළිවෙලක් අපි හැම දෙනෙක්ම සකස් කර ගත යුතුයි. එවිට ආර්ථික පැත්තත් හොඳට දියුණු කර ගන්න පුළුවන්.

ප්‍රශ්නය : කුල, ජාති ආදි වශයෙන් වූ බෙදීම් වලට විරුද්ධව බුදුරජාණන් වහන්සේ පෙනී සිටියා. නමුත් මෑත ඉතිහාසයේ අපේ සමාජය තුළ බෙදීම් රාශියක් ඇති වී තිබෙනවා. එයට හේතුව කුමක්ද? එයට විසඳුම කුමක්ද?

පිළිතුර : බුදුදහම කියන්නේ මෙසේ බෙදෙන්න හදපු ඉගැන්වීමක් නෙමෙයි. එකතු වෙන්න හදපු ඉගැන්වීමක්. බුදු රජාණන් වහන්සේ බෙදුනු හැම අවස්ථාවකදීම කළේ එකතු කිරීමයි. භාරතීය සමාජයේ ශාක්‍ය හා කෝලීය වංශ දෙක අතර රෝහිණි නදියේ ජලය බෙදා ගැනීමට යුද්ධයක් ඇති වුණා. ඒ දෙපිරිස ගඟ දෙපැත්තේ සිට යුද්ධයකට සූදානම් වෙනවා. එවිට බුදුරජාණන් වහන්සේ ගඟ මැදට ගොස් යුද්ධ කිරීමෙන් ඵලක් නැති බවත්, ඉන් ඇති වන විනාශය පිළිබඳවත් තේරුම් කර දුන්නා. බුදු දහමේ ඇති ඉගැන්වීම මෙයයි. මේ බෙදීම් සමනයකට පත් කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ ලංකාවටත් වැඩම කළ බව ඉතිහාසයේ සඳහන් වෙනවා. බුදුදහම කිසි ආකාරයකින්වත් මනුෂ්‍යයා බෙදන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ කියන්නේ බෞද්ධයෙක් ද නෙමෙයි. උන්වහන්සේට ජාතියක්, ආගමක්, කුලයක්, ගෝත්‍රයක් යන මේ කිසිවක් නැහැ. එදා සුද්දෝධන රජු, බුදුරජාණන් වහන්සේ පිණ්ඩපාතයේ යන විට ශාක්‍ය වංශයට අගෞරව වන බවට බුදුන් වහන්සේට කරුණු දක්වා සිටියා. ''මම ඔබගේ වංශයේ, කුලයේ නෙමෙයි. මගේ වංශය බුද්ධ වංශයයි. මෙය බුද්ධ වශයේ චාරිත්‍රයක්'' යනුවෙන් උන්වහන්සේ ඉතා පැහැදිලිව ප්‍රකාශ කර සිටියා. එවැනි කෙනෙකුට කිසිම ආකාරයක ආගම්, ජාති. කුල, ආගම් බෙදීම් නැහැ.

සුනීත, එදා සමාජයේ සිටි පහත්ම කුලයක කෙනෙක්. ඒ අයට සමාජයෙන් උරුම වූයේ කුණු එකතු කිරීම පමණයි. වෙන දෙයක් කිරීම තහනම්. රාජ්‍ය වංශිකයෙක්, ශාක්‍ය වංශිකයෙක් පාරේ එන විට පහත් කුල වල සියලු දෙනාම පාරෙන් ඉවත්ව කාණුවට බැසිය යුතුයි. සුනීතත් කුණු කද පැත්තකින් තබා

කාණුවට බැසි සැඟවී සිටියා. බුදුරජාණන්වහන්සේ සුනීත ළඟට ගොස් ඔබ මහන වෙන්න කැමතිද කියා ඇසුවා. තමා පහත් කුලයක කෙනෙක් නිසා මහණ විය නොහැකි බව ප්‍රකාශ කළා. බුද්ධ ශාසනයේ එවැනි බෙදීමක් නැති බවත්, ඔබ කැමති නම් මහණ කළ හැකි බවත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. මෙය කොතරම් සහනශීලි වූ ප්‍රතිපදාවක්ද? කිසිම අවස්ථාවක මනුෂ්‍යයා බෙදුවේ නැහැ. ඒ නිසා බෞද්ධයෙක් කියන්නේ බෙදීමට උත්සාහ කරන පුද්ගලයෙක් නෙමෙයි. හැම රටකටම, ජාතියකටම, ආගමකටම ආදරය කරන කෙනෙක්. සතුන්ට, ගහ කොළට පවා ආදරය කරන කෙනෙක්. සෑබෑ බුද්ධ ශ්‍රාවකයෙක් වන්නේ එවිටයි. අපි ඒ තත්ත්වයට පත් වීමට උත්සාහ කළ යුතුයි. මුළු ලෝකයාටම ඒ තත්ත්වයට පත් වීමට හැකි නම් කිසිම බෙදීමක් නැතිව සිටින්න පුළුවන්. ධර්මාශෝක රජුගේ කාලයේ වගේ ඉතාමත් ධාර්මිකව රාජ්‍ය පාලනය කරන්න පුළුවන්. පාලකයන්ට මෙහිදි වගකිව යුතුයි. පාලකයන් පක්ෂ, නිලතල වශයෙන් බෙදී සිටියහොත් රටක් ජනතාවක් එක මතයකට ගොනු කරන්න කිසිදාක හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා පාලකයාද නොබෙදී සිටිය යුතුයි. එවිට ඔහු වටා විශාල ජන සහයෝගයක් ගොඩනැගෙනවා. බුදුරජාණනන් වහන්සේ වටා ඉහල කුල වල අය පමණක් නොව පහළ කුල වල මිනිස්සු, සමාජයේ සිටි පුංචි මිනිස්සු සිටියා. මේ හැම කෙනෙක්ම කිසිම භේදයක් නොමැතිව උන්වහන්සේ වටා සිටියා. කොසොල් රජුට නැති බලයක් බුදුන්වහන්සේට ඉන්දියාව තුළ තිබුණා. ජෛන ශ්‍රාවකයන් බෞද්ධ ආරාමයක් තිබෙන ස්ථානයක පන්සලක් හදන්න පටන් ගත්තා. අනාගතයේදී ප්‍රශ්නයක් ඇති විය හැකි බැවින් එම ස්ථානයේ ඔවුන්ට ඉඩමක් ලබා නොදෙන ලෙස බුදුරජාණන් වහන්සේ රජුට දන්වා සිටියා. ආගම් දෙකක පිරිසක් එකට සිටිමෙන් ගැටුම් ඇති විය හැකි බැවින් බුදුරජාණන් වහන්සේ එසේ ප්‍රකාශ කළා. ඒ නිසා වෙනත් ස්ථානයකින් ඔවුන්ට ඉඩමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියා. නමුත් රජතුමා මේ පිළිබඳව එතරම් අවධානයක් යොමු කළේ නැහැ. එම නිසා බුදුරජාණන් වහන්සේ විශාල භික්ෂුපිරිසක් රැස්කර පෙළපළියක් ගියා. මෙම මහා සේනාව දුටු කොසොල් රජතුමා බය වුණා. ඒ විගසම බුදුරජාණන් වහන්සේගේ අදහස ක්‍රියාත්මක කිරීමට තීරණය කළා. මේ ආකාරයේ විශාල ජනබලයක් උන්වහන්සේ වටා තිබුණා. නමුත් මෙය සමාජය පෙණුනේ නැහැ. එය සමාජයට පෙණුනේ මේ

වාගේ සිදුවීම් වලදී පමණයි. භික්ෂූන් වහන්සේ කෙනෙකුටත් ලොකු සමාජ බලයක් තිබෙනවා. එයට ශක්තියක් වී ඒ වැඩපිළිවෙල ඉදිරියට ගෙනියන්න රාජ්‍ය පාලකයන්ට පුළුවන් නම් සමස්ථ ලෝකයටම ඉන් සේවයක් වෙනවා.

ප්‍රශ්නය : අද පවතින දහම් පාසල් අධ්‍යාපනයත් වෙනස් විය යුතුයි. යම් නවීකරණයක් සිදු කළ යුතුව තිබෙනවා. අපි ඒ සඳහා කළ යුත්තේ කුමක්ද?

පිළිතුර : නවීකරණය කිරීමෙන් අපි අදහස් කරන්නේ බුදුදහම ප්‍රායෝගිය කිරීමයි. බුදු දහමේ ඇති චතුරාර්ය සත්‍ය, තිසරණය, පන්සිල්, දස අකුසල් වැනි මූලික අංග පිළිබඳ දැනුමක් තිබෙනවා. නමුත් මේවා අද අපි තුළ තිබෙනවාද කියා අපි කල්පනා කළ යුතුයි. දහම් පාසල් අධ්‍යාපනයේ අරමුණ වන්නේ දැනුමෙන් පිරි පුද්ගලයන් පමණක් බිහි කිරීම පමණක් නෙමෙයි. දැනුම, ආකල්ප හා කුසලතා වලින් යුක්ත වුවක් ලෙස අධ්‍යාපනය අර්ථ ගන්වනවා. අද දැනුමට තිබෙන වටිනාකම ක්‍රමයෙන් අඩු වෙනවා. අද දැනුම සුලබ වෙලා තිබෙනවා. අද පත්තරයක්, පොතක් ගත් විට, අන්තර් ජාලය තුළින් දැනුම ලබා ගන්න පුළුවන්. නමුත් ආකල්ප හා කුසලතා දෙක ඉතාමත් වටිනවා. දහම් පාසල් දරුවෙක් ආකල්ප හා කුසලතා වලින් පිරුණු කෙනෙක් විය යුතුයි. සදාචාර සම්පන්න හැදිච්ච කෙනෙක් විය යුතුයි. රටක, ජාතියක ජීවනාලිය වන්නේ ඒ සදාචාර සම්පන්න භාවයයි. සතුන්ට, ගහකොළ වලට හා ආබාධිත අයට ඒ රටේ මිනිස්සු සලකන ආකාරය රටක සංවර්ධනය මනින් එක් මිනුම් දණ්ඩක්. එය ඉතාමත්ම හොඳ මිනුම් දණ්ඩක්. මෙයින් හැදිච්චකම, සදාචාරසම්පන්න බව මනිනවා. එය රටක සංවර්ධනය කියන්නේ එයයි. අර්ථික වශයෙන් අපි ළඟ කොතරම් මුදල් තිබුණත් සංවර්ධනය වන්නේ නැහැ. අද ලෝකයේ මානසික අවපීඩනය ඉතා වේගයෙන් පැතිරෙනවා. එය වේගයෙන් පැතිරෙන්නේ සංවර්ධිතයි කියන රට වලයි. ඉතින් ඒ රටවල සංවර්ධනයක් තිබෙනවාද? තිරසාර සංවර්ධනයක් අද අවශ්‍යයි. මෙම තිරසාර සංවර්ධනයේ අදහස සෑම පැත්තක්ම සංවර්ධනය වීමයි. අධ්‍යාත්මික, ආර්ථික හා සමාජ සංවර්ධනය යන මේ හැම එකක්ම සම්පූර්ණ විය යුතුයි. දහම් පාසලක් තුළින් මේ හැම පැත්තක්ම සංවර්ධනය කිරීම බලාපොරොත්තු වෙනවා. බුදු දහම යනු එක් ආකාරයක් අධ්‍යාත්මික

සංවර්ධනයක්. එක් ආකාරයකින් සමාජ සංවර්ධනයක්. තවත් ආකාරයකින් ආර්ථික සංවර්ධනයක්. මේ හැම කාරණයක්ම බුද්ධ දේශනාව තුළ අන්තර්ගතව තිබෙනවා.

ප්‍රශ්නය : දහම් පාසල් සහ බෞද්ධ අධ්‍යාපනය ඉදිරියට ගෙන යන්න විද්‍යුත් මාධ්‍ය භාවිතා කළ හැක්කේ කෙසේද?

පිළිතුර : මේ සඳහා විද්‍යුත් මාධ්‍යයට විශාල මෙහෙයක් කරන්න පුළුවන්. මිනිස්සුන්ට හිතන්න යමක් දීම ''මාධ්‍ය'' යන්නෙහි අදහසයි. අපි රූපවාහිනි, ගුවන් විදුලි වැඩසටහනක් හෝ පුවත්පත් සාකච්ඡාවක් හෝ සති පතා විකාශය වෙනවානම් මිනිසුන් විශාල පිරිසක් ඒ වටා ඒක රාශි වෙනවා. එහිදි ලබා දෙන පණිවිඩය පිළිබඳව ඉදිරි සතිය තුළම ඔවුන් කල්පනා කරනවා. එය හොඳ වැඩසටහනක් නම් මිනිසුන්ගේ හිත් ද හොඳ වෙනවා. එයින් මිනිසුන්ට හොරකම් කරන හැටි, මීනි මරන හැටි, වැරදි වැඩ කරන හැටි උගන්වනවා නම් එය නරකයි. මාධ්‍ය දෙපැත්ත කැපන පිහියක් වැනියි. අපි වෛද්‍යවරයෙකුට පිහියක් දෙනවා. ඔහු එයින් සාර්ථක ශල්‍ය කර්මයක් කර රෝගියෙක් සුවපත් කළා. අපි මිනීමරුවෙකුටත් ඒ පිහියම දෙනවා. ඔහු එයින් මනුෂ්‍යයෙකුම මරනවා. එය පිහිය පුද්ගලයන් දෙදෙනෙකු දෙවිදියකට භාවිතා කළා. එය සිදු වුනේ පුද්ගලයාගේ හිතේ වෙනස අනුවයි. වෛද්‍යවරයා මනුෂ්‍යයා කෙරෙහි කරුණාවෙන් පිරුණු කෙනෙක්. ඔහු එයින් හොඳ දෙයක් කළා. මිනීමරුවෙක් කියන්නේ මනුෂ්‍යයාට, ලෝකයට වෛර කරන කෙනෙක්. ඔහු එයින් නරකක් කළා. ඒ නිසා මාධ්‍ය තුළ විකාශය කරන වැඩසටහන් වෛද්‍යවරයාගේ ක්‍රියාදාමය වැනි වැඩසටහන් විය යුතුයි. එවිට සමාජයට ලොකු සෙතක් කරන්න පුළුවන්.

ප්‍රශ්නය : අපි දැන් සිටින්නේ අතරමැදි යුගයක. අපිට මින් යහපත් පැත්තකට යන්න පුළුවන්. නැතිනම් වර්තමාන තත්ත්වයට වඩා ප්‍රශ්න මතුවන්න පුළුවන්. ඔබ වහන්සේ අදහස අනුව අපි ගමන් කරන්නේ කොතැනටද?

පිළිතුර : ඇත්ත. අපි දැන් සිටින්නේ අතමැදි යුගයක. නමුත් අපේ අනාගතය සුබ බව කියන්න පුළුවන්. අද ලංකාවේ තරුණ පිරිස තුළ බුදු දහම කෙරෙහි විශාල ප්‍රබෝධයක් තිබෙනවා. බණ්ඩාරනායක අනුස්මරණ ශාලාවේදී මෑතකදී පැවති ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී බෞද්ධ පොත් පමණක් ලක්ෂ 50 ක අලෙවි වූ බව කිරම විමලජෝති හාමුදුරුවන් වහන්සේ සඳහන් කළා. මෙය පුදුමාකාර ප්‍රබෝධයක්. අපි හැම කෙනෙකුම කල්පනා කළ යුතුයි අපිට නොපෙනෙන සමාජ පණිවිඩයක් අපිට නොපෙනෙන තාලයට වේගයෙන් ඉදිරියට යනවා. අද තරුණ පිරිස් ධර්මදේශනා ඇසීමට බොහෝ සේ පැමිණෙනවා. ඒ අය කිසිම අවස්ථාවක අසුබවාදි ලෙස ජීවිතය දෙස බලන්නේ නැහැ. ඒ අය ජිවිතය දෙස බලන්නේ ධනාත්මකව, සුභවාදි ආකාරයටයි. හැම අවස්ථාවකදීම නැගී සිටින්න උත්සාහ ගන්නවා. එම උත්සාහයත් සමඟම අපි නොදකින සමාජ පරිවර්තනයක් රට තුළ සිදු වෙනවා. තව වසර දහයකින් පමණ මේ සමාජ පරිවර්තනය පරිපූර්ණභාවයට පත් වෙනවා. දේශපාලනඥයෙක් හෝ වෙනත් යම් කෙනෙක් ඒ සමාජ පරිවර්තනයට උදව් නොකර, මේ රට පරිහානියට පත් වන වැඩපිළිවෙලකට උදව් කරනවානම් ඔහු ඉදිරියේදී සමාජයෙන් ඉවත් වෙනවා. ලෝකයේ පවතින ධර්මතාවය මෙයයි. මේ ධර්මය, සත්‍ය, යථාර්තය කියන දෙය කිසිදාක යටපත් කරන්න බැහැ. එය තුළ පුදුමාකාර ශක්තියක්, බලයක් තිබෙනවා. ධර්මය, සත්‍ය රජ කරවීමේ වැඩපිළිවෙලක් රාජ්‍ය පාලකයෙක්, සමාජය සේවකයෙක් නිරතුව කළ යුතුයි. ඔහුගේ ආරක්ෂාව තිබෙන්නේ ඔහුගේ වැඩපිළිවෙල තුළයි. අපේ ජාතිය අවදි කිරීමට යන මේ වැඩපිළිවෙල තුළ අවුරුදු දහයකින් මේ ඇල් මැරුණු ගති දුරු වෙලා ලංකාවට සෞභාග්‍යමත් අනාගතයක් උදා වන බවට පෙර නිමිති දකින්නට තිබෙනවා. අපේ රටේ තරුණ පිරිස, ළමයි නරක නැහැ. ඒ නිසා කවර රජයක් රට පාලනය කළත් මේ පිබිදීගෙන එන ප්‍රබෝධය ඉස්මතු කිරීම ඒ අයගේ ලොකු වගකීමක්. ඒ සඳහා අවශ්‍ය පරිසරය ගොඩ නගා ඔවුන්ට ඉදිරියට ගමන් කිරීමට අවස්ථාව උදා කර දිය යුතුයි. එවිට අපි බලාපොරොත්තු වන සිහිනය මල් පල ගැන්වෙනවා. රජයෙන් හෝ වෙනත් ආකාරයකින් අනුග්‍රහයක් නොලැබුණත් ස්වශක්තියෙන් නැගී සිටින පිරිසක් ලෝකයේ ඇති වී තිබෙනවා. විශේෂයෙන්ම අපේ රට තුළ සිටිනවා. පුදුම ආකාරයේ උනන්දුවක් තිබෙන තරුණ පිරිස් අපි

දැක තිබෙනවා. පසුගිය කාලයේ ගංවතුර ගලපු අවස්ථාවේදී අපේ රටට විශාල හානියක් වුනා. ''කිසිවක් නැහැ හාමුදුරුවනේ, දැන් තිබෙන්නේ පස් පමණයි'' කියමින් එහිදි එක් තරුණයෙක් ඔහුගේ ගෙය, කඩය තිබු ස්ථානය අඩමින් මට පෙන්වා දුන්නා. නමුත් ඔහු ජිවිතයට මුහුණ දුන්නා. මෙතරම් ප්‍රබල ජවයක්, ඉවසීමක්, ශක්තියක් අපි සෑම කෙනෙක් තුළ තියෙනවා. මෙවැනි අය අපේ සමාජය තුළ ජිවත් වෙනවා. ඒ නිසා මේ ලංකාව හොඳ, සුබ, දියුණු වු තැනක් බවට පත් කිරීම මහ අරුමයක් නොවේ. එය ඉතා පහසු දෙයක්. නිවැරදි නායකත්වයක් තුළින් මෙහෙය වීම පමණයි කළ යුත්තේ.

ප්‍රශ්නය : ඔබ වහන්සේට සමාජයට දෙන්න එක් අවවාදයක්, උපදෙසක් තිබෙනවානම් එය කුමක්ද?

පිළිතුර : සෑම මනුෂ්‍යයෙක්ම අනෙක් අය තේරුම් ගැනීමට උත්සාහ ගත යුතුයි. අනෙක් අයත් අපි වගේමයි. කිසිම වේලාවක ලෝකයට වෛර කරන්න, තරහා කරන්න හොඳ නැහැ. අපි හැම කෙනාම සමගියෙන්, සමාදානයෙන්, සහජීවනයෙන් ජීවත් වන පරිසරයක් ගොඩ නැගිය යුතුයි. එසේ යහපත් පරිසරයත් ගොඩ නංවා ස්වශක්තියෙන් නැගී සිටීමට අපි සෑම කෙනෙක්ම උත්සාහ ගත යුතුයි. අද අවශ්‍ය වන්නේ එයයි. ''ඔබලාට පිහිට, ඔබලාමයි'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ එයයි. වෙන බාහිර බලවේගයකින් මනුෂ්‍යයෙකුට පිහිටක් නැහැ. මනුෂ්‍යයාගේ පිහිට මනුෂ්‍යයාමයි. මනුෂ්‍යයාගේ දියුණුව, විනාශය, පිරිමි යන මේ සිල්ලේම සර්වබලධාරීත්වය මනුෂ්‍යයාට උරුම කර දී තිබෙනවා. ස්වශක්තියෙන් නැගී සිට, අධ්‍යාපනය, ආර්ථිකය යන සෑම පැත්තක්ම සංවර්ධන කර ගැනීමට ඔබ හැම කෙනෙක්ම උත්සාහ ගන්න. එවිට රටට, ජාතියට හා ඔබට සුබ අනාගතයක් උදා වෙනවා.

ස්තුතියි ස්වාමීන් වහන්ස.